# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,210- 2021 ජනවාරි මස 08 වැනි සිකුරාදා - 2021.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | — |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |

සැ. යු. -(i) *ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධන සංවිධානය (සංස්ථාගත) කිරීමේ පනත් කෙටුම්පත 2021 ජනවාරි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.*

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ජනවාරි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජනවාරි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1- B 82093 - 5,403 (2021/01)

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - කැස්බෑව

අධිකරණයට ඉදිරිපත් කරන ලද භාණ්ඩ වෙන්දේසි කිරීම

කැස්බෑව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් 2021.02.06 වැනි සෙනසුරාදා දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා ගෙන වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් එදින පෙ. ව. 9.00 සිට පෙ. ව. 10.00 දක්වා පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලන්සුව නොපිලිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමට අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගන්නා ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේ දීම මුදල් ගෙවිය යුතු අතර එවෙලේ ම අධිකණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් මුදල් ඇනවුම් ආදිය කිසිසේත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ හා සමාන පිළිගත හැකි ලියවිල්ලකින් තහවුරු කළ යුතු ය.

රුචිර වැලිවත්ත,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
කැස්බෑව.

2020 දෙසැම්බර් මස 30 වැනි දින,
කැස්බෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | |
|---|---|---|---|
| 1. | AR/192/19 | WP/XO/7082 යතුරු පැදිය | |
| 2. | 75363 | 109-9474 යතුරු පැදිය | |
| 3. | BR/1226/17 | WP/HS/8685 යතුරු පැදිය | |
| 4. | BR/1369/14 | 132/8156 යතුරු පැදිය | |
| 5. | 45465 | UP/WN/0681 යතුරු පැදිය | |
| 6. | 66601 | WPMY 6649 යතුරු පැදිය | |
| 7. | 69968 | WPBAJ 1900 යතුරු පැදිය | |
| 8. | BR/2234/16 | WP - AAP 3447 ත්‍රීරෝද රථය | |
| 9. | AR/90/20 | WPBAS 4292 යතුරු පැදිය | |
| 10. | AR/2423/19 | WPVM 7914 යතුරු පැදිය | |
| 11. | AR/2424/19 | WPXR 2110 යතුරු පැදිය | |
| 12. | AR/2425/19 | BCS 0524 යතුරු පැදිය | |
| 13. | AR/92/20 | WPMW 3805 යතුරු පැදිය | |
| 14. | AR/126/20 | WPBDK 9449 යතුරු පැදිය | |
| 15. | AR/127/20 | NWJX 5427 යතුරු පැදිය | |
| 16. | AR/533/18 | 110-0609 යතුරු පැදිය | |
| 17. | 51310 | 112-9591 යතුරු පැදිය | |
| 18. | 50725 | WP/TS/8943 යතුරු පැදිය | |
| 19. | 25489 | 93 ශ්‍රී 5095 යතුරු පැදිය | |
| 20. | BR/1418/14 | SP/BAE 1529 යතුරු පැදිය | |
| 21. | 75363 | 146-9692 යතුරු පැදිය | |
| 22. | 56053 | NW/TV/1800 යතුරු පැදිය | |
| 23. | 92524 | 122- 6987 යතුරු පැදිය | |
| 24. | AR/125/20 | 123- 2152 යතුරු පැදිය | |
| 25. | 3624 පස් කියුබ් | | 02 |
| 26. | 3622 පස් කියුබ් | | 02 |
| 27. | 3625 පස් කියුබ් | | 02 |
| 28. | 3825 පස් කියුබ් | | 02 |
| 29. | 3934 පස් කියුබ් | | 02 |
| 30. | 93902 පස් කියුබ් | | 01 |
| 31. | අල්මාරි වානේ | | 03 |
| 32. | කැබිනට් ලාච්චු 04 | | 03 |
| 33. | කැබිනට් ලාච්චු 03 | | 01 |
| 34. | මුදල් පෙට්ටි | | 01 |
| 35. | සුපර් ෆැක්ස් | | 03 |
| 36. | ප්‍රින්ටර් | | 06 |
| 37. | පුටු (ඇඳි) | | 15 |
| 38. | පුටු (සාමාන්‍ය) | | 01 |
| 39. | පුටු (සාමාන්‍ය යකඩ) | | 03 |
| 40. | පුටු (විධායක) | | 03 |
| 41. | පරිගණක පුටු | | 02 |
| 42. | පරිගණක මේස | | 01 |
| 43. | මේස (සාමාන්‍ය) | | 01 |
| 44. | බන්දේසි ලී | | 03 |
| 45. | පරිගණක මොනිටර් | | 05 |
| 46. | යූ. පී. එස්. | | 12 |
| 47. | සී. පී. යූ. | | 04 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | |
|---|---|---|---|
| 48. | | කී බෝර්ඩ් | 03 |
| 49. | | මවුස් | 03 |
| 50. | | මේස විදුලි පංකා | 03 |
| 51. | | ස්ටෑන්ඩ් පංකා විදුලි | 03 |
| 52. | | සිවිලිං පංකා විදුලි | 02 |
| 53. | | 5304 පස් කියුබ් | 03 |
| 54. | | 5305 පස් කියුබ් | 03 |
| 55. | | 5307 පස් කියුබ් | 03 |
| 56. | | විවිධ නඩුවලට අදාළ ප්ලාස්ටික් බැරල් 15ක් | |
| 57. | | විවධ නඩුවලට අදාළ ප්ලාස්ටික් බූලි තොගයක් | |
| 58. | | වීදුරු හා ප්ලාස්ටික් බෝතල් තොගයක් | |

01-291

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - බිබිල

### රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපෑ නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණ නඩුකරයන්ට අදාළව නඩු භාණ්ඩ ලෙස ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍යයන් අතරින් රාජසන්තක කිරීමට යටත් වූ හිමිකම් නොපෑ පහත සඳහන් ද්‍රව්‍යයන් 2021 ජනවාරි මස 16 වැනි දින පෙ. ව. 9.00 සිට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

02. මෙහි සඳහන් නඩු භාණ්ඩ අතරින් යමකට හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය දින වෙන්දේසියට එකී භාණ්ඩ ඉදිරිපත් කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කර තහවුරු කළ යුතු ය.

03. වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ද්‍රව්‍ය වෙන්දේසි දින දී වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙරාතුව අධිකරණ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබාගෙන පරීක්ෂා කිරීමට කටයුතු කළ හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළි නොගෙනෙන අවස්ථාවක දී අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එකී අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් එදින පස්වරු 4.00 ට පෙර ඉවත්කර ගත යුතු අතර, මුදලින් පමණක් ගෙවීම් කළ යුතු ය.

06. භාණ්ඩ වෙන්දේසියේ දී භාණ්ඩ ඉල්ලුම්කරන්නන් සිය අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත හෝ වෙනත් අනන්‍යතා සහතික පත්‍රයක් ඉදිරිපත් කිරීමට වග බලා ගත යුතු ය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
බිබිල.

2020 දෙසැම්බර් මස 30 වැනි දින,
බිබිල මහෙස්ත්‍රාත් අධිකරණයේදී ය.

### භාණ්ඩ ලැයිස්තුව

මහෙස්ත්‍රාත් අධිකරණය - බිබිල

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 01. | විවිධ නඩු අංකයන්ට අදාළ | උදළු 05යි |
| 02. | විවිධ නඩු අංකයන්ට අදාළ | සවල් 05යි |
| 03. | විවිධ නඩු අංකයන්ට අදාළ | පොඩි පොරොව 01යි |
| 04. | විවිධ නඩු අංකයන්ට අදාළ | ප්ලාස්ටික් පුටු 05යි, ස්ටූල් 01යි |
| 05. | විවිධ නඩු අංකයන්ට අදාළ | කුළු ගෙඩි 01යි |
| 06. | විවිධ නඩු අංකයන්ට අදාළ | පොඩි වැලි බාල්දි 06යි ලොකු වැලි බාල්දි 01යි |
| 07. | විවිධ නඩු අංකයන්ට අදාළ | ලොකු ප්ලාස්ටික් බැරල් 01යි |
| 08. | විවිධ නඩු අංකයන්ට අදාළ | ඉල්ලංකුරු 01යි |
| 09. | විවිධ නඩු අංකයන්ට අදාළ | ඇඳුම් උදලු 02යි |
| 10. | විවිධ නඩු අංකයන්ට අදාළ | ලොකු සින්තා පැදුරු 01යි |
| 11. | විවිධ නඩු අංකයන්ට අදාළ | කැති 07යි |
| 12. | විවිධ නඩු අංකයන්ට අදාළ | ප්ලාස්ටික් ලොකු බූලි 20 යි |
| 13. | විවිධ නඩු අංකයන්ට අදාළ | ප්ලාස්ටික් කළ 25යි |
| 14. | විවිධ නඩු අංකයන්ට අදාළ | ප්ලාස්ටික් කෑන් 50යි |
| 15. | විවිධ නඩු අංකයන්ට අදාළ | ප්ලාස්ටික් පොඩි කෑන් 50යි |
| 16. | 44746 නඩුවට අදලව | 12.05kg ගෑස් සිලින්ඩර් 01යි. පොඩිගෑස් ලිප් 01යි |
| 17. | 44575 නඩුවට අදාළව | 12.05kg ගෑස් සිලින්ඩර් 01යි/යකඩ ගෑස් ලිප් 01යි |
| 18. | 46310 නඩුවට අදාළව | වතුර මෝටර් 01යි, අඩි 57 පමණ දිග ප්ලාස්ටික් හෝස් 01/අඩි 175 පමණ දිග වයර් කෝඩ් 01යි. |

01-374

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

කොළඹ 8, කාසල් වීදිය, 168 හි සහ දැනට ඇමරිකාව, විස්කොන්සින් W 153158 ප්ලෙසන්ට් ප්රෙයරි, 48 වන පාර, 10143 හි පදිංචි ලානු ගුණවර්ධන හෙවත් ලානු චන්දිම ගුණවර්ධන (ශ්‍රී ලංකා පුරවැසි සහතික 0800074553 සහ ඇමරිකානු ගමන් බලපත් 566437059) වන මා විසින් කොළඹ 8, කාසල් වීදිය, 168 හි ශාන්තිනි ගුණවර්ධන (ජාතික හැඳුනුම්පත් අංක 407561198V) මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කළ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. බී. කලටුවාව ලියා සහතික කළ අංක 2937 සහ 2015.07.02 දිනැති ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2020 නොවැම්බර් මස 25 වැනි දින පටන් අවලංගු කර අහෝසි කළ බව මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් දැනුම් දෙමි.

ලානු ගුණවර්ධන හෙවත් ලානු චන්දිම ගුණවර්ධන.

2020 නොවැම්බර් මස 25 වැනි දින දී ය.

01-292

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

මහරගම, දෙහිවල පාර, සිසිල ගාර්ඩන්ස් අංක 216/8 සී දරන ස්ථානයේ සහ දැනට 6626 වෙන්චූරා, කැන්යොන් ඇව්නිව්, වැන්නුයුස් සී. ඒ. 91401 ඇමරිකා එක්සත් ජනපදය දරන ස්ථානයේ පදිංචි ඇන්තනී බදුගේ ලාල් සිල්වා වන මම මා විසින් පිළියන්දල, වෑවල, පල්ලිය පාර, අංක 12/10 හි පදිංචි ඇන්තනී බදුගේ රවින්ද්‍ර ප්‍රියන්ත සිල්වා යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් පී. ජේ. සේමරත්න විසින් ලියා සහතික කරන ලද අංක 4519 හා වර්ෂ 2017.02.08 දින ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කළ බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙමි. මින් මතු එකී ඇටෝර්නි බලපත්‍රය මත එකී ඇටර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගණුදෙනුවකට මම කිසිදු වගකීමක් නොදරන බව මෙයින් දැනුම් දෙමි.

ඒ. බී. එල්. සිල්වා.

01-298

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

ඇග්ස්ටාර් ප්‍රොපර්ටි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම

ඇග්ස්ටාර් පීඑල්සී සමාගම සමග ඒකාබද්ධ කිරීම

ඇග්ස්ටාර් ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (සමාගම් ලියාපදිංචි අංකය - පීවී 84941), ඇග්ස්ටාර් පීඑල්සී සමාගම (සමාගම් ලියාපදිංචි අංකය පීවී 1618 PB/PQ) සමග, 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කිරීම පිළිබඳව එම පනතේ 244 වගන්තියෙහි (3) (බී) උප වගන්තිය ප්‍රකාරව කෙරෙනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි.

යෝජිත ඇග්ස්ටාර් ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, ඇග්ස්ටාර් පීඑල්සී සමාගම සමග ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් 2020 ජූලි මස 06 වැනි දිනැති කොළඹ බෙදා හරින ලද දිනමිණ, ඩේලිනිව්ස් හා තිනකරන් පුවත්පත්වල පළකරන ලද පෙර දැන්වීම හා 2020 ජූලි 24 දිනැතිව රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීම ප්‍රකාරව, නියමිතව තිබූ අදාළ ඒකාබද්ධ කිරීම දැන් සම්පූර්ණ කොට ඇති බවත්, ඒකාබද්ධ සහතිකයෙහි සඳහන් දිනය වන 2020 ඔක්තෝබර් මස 12 වැනි දින සිට අදාළ ඒකාබද්ධ කිරීම බලාත්මක වන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇග්ස්ටාර් පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2020 දෙසැම්බර් මස 08 වැනි දින දී ය.

01-329

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

සියෙරා ෆාමසියුටිකල් (ප්‍රයිවට්) ලිමිටඩ් හා එස් ඊ ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම්, සියෙරා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සමග ඒකාබද්ධ කිරීම

සියෙරා ෆාමසියුටිකල් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි අංකය : පීවී 4052) හා එස් ඊ ඩිස්ට්‍රිබුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි අංකය : පීවී 8399) යන සමාගම් දෙක සියෙරා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි අංකය පීවී 4811) සමාගම සමග, 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (2) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කිරීමේ යෝජනා පිළිබඳව එම පනතේ 242 (3) (බී) වගන්තිය ප්‍රකාරව කෙරෙනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි.

සියෙරා ෆාම්සියුටිකල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ හා එස් ඊ ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ සහ එම පරිපාලිත සමාගම්වල පූර්ණ අයිතිය හිමි සියෙරා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල විසින් අදාළ සමාගම් පනතේ 242 (2) වගන්තිය ප්‍රකාරව, එකී සියෙරා ෆාමසියුටිකල් (ප්‍රයිවට්) ලිමිටඩ් එස්. ඊ. ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් දෙක සියෙරා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සමග ඒකාබද්ධ කිරීමට 2020 දෙසැම්බර් මස 30 වැනි දින සභා සම්මත කිරීමට නියමිත අතර, ඒ හේතුවෙන් සියෙරා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම තවදුරටත් ක්‍රියාත්මකව පවතිනු ඇති අතර, සියෙරා ෆමසියුටිකල්

(ප්‍රයිවට්) ලිමිටඩ් හා එස් ඊ ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම්වල ක්‍රියාකාරිත්වය මින් පසු අහෝසි වනු ඇත.

මෙම දැන්වීම පළ වූ දින සිට දින 20කට නොඅඩු දිනයකදී, අදාල සමාගම් පනතේ 243 වගන්තිය ප්‍රකාරව එහි සඳහන් ලේඛන සමග සියෙරා ෆාමසියුටිකල් (ප්‍රයිවට්) ලිමිටඩ් එස්. ඊ. ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හා සියෙරා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් විසින් අදාළ ඒකාබද්ධ කිරීමේ යෝජනාව ලියාපදිංචි කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත අයදුම්කිරීමට අනුගාමීව, එකී පනතේ 242(2) වගන්ති ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අදාළ ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් කිරීමෙන් අනතුරුව එම ඒකාබද්ධ කිරීම බලාත්මක වනු ඇත.

අදළ පනතේ 242 (4) වගන්තිය ප්‍රකාරව එම ඒකාබද්ධ කිරීමේ යෝජනාව තුළ සියෙරා ෆාමසියුටිකල් (ප්‍රයිවට්) ලිමිටඩ් එස් ඊ ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හා සියෙරා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් සහා සම්මත කළ කරුණු ඇතුළත් බවට හැඟි යන යෝජිත ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් ඕනෑම සමාගම්වල කොටස් හිමියකු හට ණය හිමියකු හට හෝ සමාගමට බැඳීම් සහිත ඕනෑම අයෙකුහට සමාගමේ ලේකම්වරුන්ගේ කාර්යාලය වන පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 59, ග්‍රෙගරිපාර, කොළඹ 07 යන ස්ථානයෙන්, සාමාන්‍ය ව්‍යාපාරික වේලාවන් තුළ දී ලබාගත හැක.

සමාගමේ කොටස් හිමියෙකු හෝ ණය හිමියකුහට හෝ සමාගම වෙත බැඳීම් සහිත අයකුහට, ඉල්ලීමක් කළහොත් අදළ ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් නොමිලයේ ලබාගැනීමට හිමිකම ඇත.

සියෙරා ෆාමසියුටිකල් (ප්‍රයිවට්) ලිමිටඩ්, එස් ඊ ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හා සියෙරා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම්වල

අධ්‍යක්ෂ මණ්ඩලවල අණ පරිදි,

පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2020 දෙසැම්බර් මස 03 වැනි දින දී ය.

01-330

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2020 දෙසැම්බර් මස 15 දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : නැරේට්ව් ඩිසයින් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00231784
ලියාපදිංචි ලිපිනය : 14/2 සී, පමුණුව , මහරගම, 10280

කේ. ඒ. ඩී. නිමාශි රුක්සලා මිය,
ලේකම්.

01-363

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ ඉංග්‍රීසි නාමය 2020.09.22 දින සිට වෙනස්වීම මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ කලින් නම : වෙස්ට්ගේට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අලුත් නම : වෙස්ට්ගේට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 677
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නො. 77, ශ්‍රී සරණංකර පාර, දෙහිවල

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

01-407

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම 2020.09.15 දින සිට වෙනස්වීම මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ කලින් නම : ප්‍රබෝධා ඩයග්නොස්ටික් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අලුත් නම : ප්‍රබෝධා ඇග්‍රි බිස්නස් (පීවීටී)එල්ටීඩී
සමාගමේ අංකය : පී. වී. 108788
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : පන්ඩුකාභය මාවත, අම්පාර

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

01-408

---

## ඇටොර්නි බලපත්‍රය අවලංගු කිරීම

කඩවත, කපුහේනවත්ත, අංක 485 හි පදිංචි උපේඛා රන්දි ඉරේෂා වික්‍රමසිංහ වන මා ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයටත්, එහි ජනතාවටත් මින් දැනුම් දෙන වගනම්, මා විසින් මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් මිලාන් එරංග උදන වික්‍රමසිංහ යන අය පත් කරමින් දෙන ලද අංක 979 සහ 2018.07.15 වැනි දින දරන ඩී. සී. එස්. අබයවීර නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍ර පොතේ 248 කාණ්ඩයේ 124 පත්‍රිරුවේ දින පොත් අංකය 15858 යටතේ 2018.09.11 දතම යටතේ ලියාපදිංචිව ඇති ඇටෝර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවත්, මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවත් ය.

යූ. ආර්. අයි. වික්‍රමසිංහ.

01-409

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 59 (2) වගන්තිය යටතේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 59(1) වගන්තිය ප්‍රකාරව අංක 160/16, කිරිමණ්ඩල මාවත, කොළඹ 05, දරන ලිපිනයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ට්‍රාන්ස්නැෂනල් ලංකා (පීවීටී) එල්ටීඩී, එම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ශ්‍රී ලංකා රුපියල් හැටපස් මිලියන් අටසිය විසි තුන් දහස් හැත්තෑවේ (රු. 65,823.070) සිට රුපියල් දහස මිලියන් පන්සිය විසිතුන් දහස් එකසිය තිස් එක (රු. 10,523,131) දක්වා අඩු කිරීමට යෝජනා කර ඇති බව මෙයින් දැනුම් දෙමු.

ට්‍රාන්ස්නැෂනල් ලංකා (පීවීටී) එල්ටීඩී සමාගම,
(පෙර සමාගමේ නම ට්‍රාන්ස්නැෂනල් ලොජිස්ටික්ස් සොලියුෂන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්)
සඳහා සහ වෙනුවෙන්

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී
සමාගම් ලේකම්වරුන්.
(පෙර සමාගම් ලේකම්වරුන් මැනේජර්ස්
ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්)

2020 ජුනි මස 9 වැනි දින දී ය.

01-410

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

ලොටස් ෆෝහන්ඩ්‍රඩ් ඇන්ඩ් ෆිෆ්ටිසික්ස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 94800), ෆ්ලෝරි විලා (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 73824), මායා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 72036) සහ ට්‍රස්ට් ඉන්වෙස්ට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් (පි වී 78617) යන සමාගම් ඒකාබද්ධ වීමේ නිවේදනයයි

ලොටස් ෆෝහන්ඩ්‍රඩ් ඇන්ඩ් ෆිෆ්ටිසික්ස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ෆ්ලෝරි විලා (ප්‍රයිවට්) ලිමිටඩ්, මායා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, සහ ට්‍රස්ට් ඉන්වෙස්ට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත අදාළ සමාගම් හතර, 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කොට, තවදුරටත් ලොටස් ෆෝහන්ඩ්‍රඩ් ඇන්ඩ් ෆිෆ්ටිසික්ස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ තනි සමාගමක් වශයෙන් පවත්වාගෙන යාමට තීරණය කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීම සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් අනුමත කරන දිනයක සිට ක්‍රියාත්මක වීමට නියමිතයි.

අධ්‍යක්ෂවරු.

ලොටස් ෆෝහන්ඩ්‍රඩ් ඇන්ඩ් ෆිෆ්ටිසික්ස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්. ෆ්ලෝරි විලා ප්‍රයිවට් (ලිමිටඩ්), මායා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ට්‍රස්ට් ඉන්වෙස්ට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්.

01-415

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

වැන් ඇම්ස්ටර්ඩෑම් ඇන්ඩ් මිලන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 69823) සහ එලියට් බන්ගලෝ (ප්‍රයිවට්) ලිමටඩ් (පී වී 70226) යන සමාගම් ඒකාබද්ධ විමේ නිවේදනයයි.

වැන් ඇම්ස්ටර්ඩෑම් ඇන්ඩ් මිලන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ එලියට් බන්ගලෝ (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයන් මත අදාළ සමාගම් දෙක 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කොට, තවදුරටත් වැන් ඇම්ස්ටර්ඩෑම් ඇන්ඩ් මිලන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ තනි සමාගමක් වශයෙන් පවත්වාගෙන යාමට තීරණය කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීම සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් අනුමත කරන දිනයක සිට ක්‍රියාත්මක වීමට නියමිතයි.

අධ්‍යක්ෂවරු.

වැන් ඇම්ස්ටර්ඩෑම් ඇන්ඩ් මිලන් ඉන්වෙස්ට්මන්ට්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ් සහ එලියට් බන්ගලෝ (ප්‍රයිවට්) ලිමිටඩ්.

01-416

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පතේ 59(2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ ප්‍රාග්ධනය අවකරණය පිළිබඳව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : බීච් එස්කේප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 85431
සමාගමේ ලිපිනය : සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලේකම්වරු, නො. 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05.

අවකරණයට පෙර ප්‍රාග්ධනය : රු. 4,871,000
අවකරණයට පසු ප්‍රාග්ධනය : රු. 101
අවකරණය කරන මුදල : රු. 4,870,899

සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු,

නො. 10, හැව්ලොක් පෙදෙස,
කොළඹ 05

01-417

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි.**

හැටන්, දිඹුල පාරේ වරිපනම් අංක 199/80 දරන ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ලක් සහිත අගනා දේපළ වෙන්දේසියක්.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම කොට්ඨාසයේ අඹගමුව කෝරළේ [ 319D] හැටන් උතුර ග්‍රාම නිලධාරි වසමේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැටන් - දික්ඔය නගර සභා සීමාවේ හැටන් දිඹුලාගල පාරේ වරිපනම් අංක 199/80 දරන පරිශ්‍රයේ පිහිටා ඇති ''හැටන් එස්ටේට්'' නමැති ඉඩමේ කොටසක් වන බලයලත් මිනින්දෝරු ඩී.එල්. ඩී. වයි විජේවර්ධන විසින් 1995 අගෝස්තු මස 31 වැනි දින මැන සාදන ලද අංක 7446 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 දරන ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ආදී සියළු දේ සහ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම කොට්ඨාසයේ අඹගමුව කෝරළේ [ 319D] හැටන් උතුර ග්‍රාම නිලධාරි වසමේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැටන් - දික්ඔය නගර සභා සීමාවේ හැටන් දිඹුලාගල පාරේ වරිපනම් අංක 199/80 දරන පරිශ්‍රයේ පිහිටා ඇති ''හැටන් එස්ටේට්'' නමැති ඉඩමේ කොටසක් වන බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් 1995 අගෝස්තු මස 31 වැනි දින මැන සාදන ලද අංක 7446 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 දරන ඉඩම් කොටස නැවත බෙදා වෙන් කරන ලද හැටන් බලයලත් මිනින්දෝරු සුමංගලී සුබ්‍රමාණියම් 1995 අගෝස්තු මස 23 වැනි දින මැන සාදන ලද අංක 3159/2014 දරන පිඹුර නිරූපිත කැබලි අංක 2 දරන ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ආදී සියළු දේ.

ප්‍රසිද්ධ නොතාරිස් එන්. එච්. හෙට්ටිආරච්චි විසින් 2018 සැප්තැම්බර් මස 3 වන දින සහතික කරන ලද අංක 42 දරන DFCC Bank PLC.) (Successor to DFCC Vardhana Bank PLC) නමට ලියන ලද බැඳුම්කරය මත අයවිය යුතු මුදල ගෙවීමට කුමාරසාමි මාදන් කුමාර් සහ වසන්තකෝකිලන් ප්‍රශාන්තී ණයකරුවන් වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත කැබලි අංක 1, පර්චස් 8.2 සහ කැබලි අංක 2, පර්චස් 0.75 සමග එහි පිහිටි ගොඩනැගිලි ආදී සියළු දේ.

2021 ක්වූ පෙබරවාරි මස 19 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2020.09.11 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2020.08.31 වැනි දින දිනපතා ''දිවයින'' ''ද අයිලන්ඩ්'' සහ ''තිනකුරල්'' යන පුවත් පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්‍ය වන මාර්ගය*.- හැටන් මධ්‍යම බස් නැවතුම්පොල සිර නුවර පාරේ ඔස්සේ කි. මී. 1/2ක් පමණ (ඉන්ද්‍රා හෝටල් පරිශ්‍රය) දක්වා ගමන් කර වමට හැරී දිඹුල පාරේ 2 වන පටුමග (හිල් විදිය) දක්වා ගමන් කර එතැන් සිට ඉදිරියට තවත් මීටර් 100ක් පමණ ගමන් කිරීමෙන් පාරේ දකුණු පසින් පාරට මායිම් පිහිටා ඇති මෙම දේපලට ප්‍රවිශ්‍ය විය හැකි ය.

වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි.- (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් සහ ඒ මත අයවිය යුතු බදු ද, (4) සියළුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතු වන අතර ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද ගෙවිය යුතු යි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 73. DFCC බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකරු, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 011-2371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 672082 ෆැක්ස් අංකය : 2871184.

01-411

---

**1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

කුරුණෑගල පිහිටි 1 වන දේපල කුරුණෑගල වෙහෙර නිස්සංක මාවතේ 3 වන පටුමගේ වරිපනම් අංක 38/38 දරන පරිශ්‍රය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වේඋඩ විල්ලි හත් පත්තුවේ තිරගන්දහය කෝරළේ කුරුණෑගල මහ නගර සභා සීමාවේ

කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 837 කුරුණෑගල නගරයේ ග්‍රාම සේවා නිළධාරි වසමේ වෙහෙර ග්‍රාමයේ පිහිටා ඇති බලයලත් මිනින්දෝරු ජේ. රාජපක්ෂ විසින් 1997 ජුනි මස 23 වැනි දින මැන සකස් කරන ලද අංක 257 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 01 දරන කුරුණෑගල වෙහෙර, නිස්සංක මාවතේ 3 වන පටුමගේ පිහිටි වරිපනම් අංක 38/38 දරන පරිශ්‍රය.

ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් 2016 මාර්තු මස 29 වන දින සහතික කරන ලද අංක 21417 සහ 2018 නොවැම්බර් මස 5 වැනි දින සහතික කරන ලද අංක 24105 දරන DFCC Bank PLC.) (Successor to DFCC Vardhana Bank PLC) නමට ලියන ලද බැඳුම්කරය මත අයවිය යුතු මුදල ගෙවීමට රසාක් මොහොමදු රිෂ්කාන් ණයකරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත පර්චස් 7.1 විශාලැති (අ. 0, රූ. 0, පර්. 7.1) දේපළ ගොඩනැගිලි, වැව්ලි ආදී සියලු දේ සමගින් 2021 ක් වූ පෙබරවාරි මස 24 වැනි දින පෙ.ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.-* කුරුණෑගල නගර මැද සිට කොළඹ මාර්ගය ඔස්සේ කි. මී. 1 1/2 පමණ ගමන් කර දකුණට හැරී මීටර් 100ක් පමණ නිශ්ශංක මාවත ඔස්සේ ගමන් කොට නැවතත් දකුණට හැරී මීටර් 25ක් ගමන් කිරීමෙන් පාරේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගනේමුල්ල පිහිටි 2 වන දේපළ .-*

බස්නාහිර පලාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ මැද පත්තුවේ ගම්පහ ප්‍රාදේශීය සභා සීමාවේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 236 - සී නැඳුන ග්‍රාම සේවා නිළධාරි වසමේ ගණේමුල්ල ග්‍රාමයේ පිහිටා ඇති බලයලත් මිනින්දෝරු ජේ. එස්. බී. ජයසේකර විසින් 1989 සැප්තැම්බර් මස 1 වන දින මැන සකස් කරන ලද අංක 4275 දරන පිඹුරේ සඳහන් කර ඇති හිග්ගහලන්ද සහ කීනගහලන්ද එහෙත් වැරදිව සඳහන් කර ඇති ''කීනගහලන්ද'' නමැති ඉඩම

ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී වඳුරාගල විසින් 2019 ජූලි මස 12 වැනි දින සහතික කරන ලද අංක 24758 දරන DFCC Bank PLC.) (Successor to DFCC Vardhana Bank PLC) නමට ලියන ලද බැඳුම්කරය මත අයවිය යුතු මුදල ගෙවීමට රසාක් මොහොමදු රිෂ්කාන් ණයකරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත පර්චස් 20 විශාලැති (අ. 0, රූ. 0, පර්. 20) දේපළ ගොඩනැගිලි, වැව්ලි ආදී සියලු දේ සමගින් 2021 ක්වූ පෙබරවාරි මස 24 වැනි දින ප. ව. 3.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.-* ගනේමුල්ල නගරයේ සිට ගම්පහ පාර ඔස්සේ මීටර් 750ක් ගමන් කර දකුණට හැරී රණවිරු සම්පත් කුමාර මාවතේ මීටර් 300ක් පමණ ඉදිරියට ගමන් කිරීමෙන් වරිපනම් අංක 424/2 දරන මෙම දේපළ පාරට මුහුණ ලා පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් "COVID 19" වසංගතය සම්බන්ධයෙන් නිකුත් කරන ලද නිශ්චිත නිර්නායක අනුගමනය කරමින් මෙම වෙන්දේසි පවත්වනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2020.10.29 වැනිදින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය ද, 2020.10.20 වැනි දින ''දිනපතා දිවයින'' දී අයිලන්ඩ් පුවත්පත් සහ ''තිනකරන්'' යන පුවත් පත් බලන්න.

වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි.- (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් සහ ඒ මත අයවිය යුතු බදු ද, (4) සියළුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතු වන අතර ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද ගෙවිය යුතු යි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 73. DFCC බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකරු, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 011-2371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 672082 ෆැක්ස් අංකය : 2871184.

01-413

---

**1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි.**

පාමන්කඩ හැම්ඩන් පටුමගේ වරිපනම් අංක 23 8/2 දරන ස්ථානයේ පිහිටි අගනා සහාධිපත්‍ය මහල් නිවාසයක් වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ සහ නගර සභා පරිපාලන සීමාවේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර පාමන්කඩ ග්‍රාම නිලධාරි වසමේ පාමන්කඩ කොට්ඨාස අංක 46 හි හැම්ඩන් පටුමගේ

පිහිටා ඇති බලයලත් මිනින්දෝරු කේ. කනගලිංගම් විසින් 2018 අගෝස්තු මස 06 වැනි දින මැන සකස් කරන ලද අංක 5488 දරන සභාධිපත්‍ය පිඹුරේ සඳහන් සභාධිපත්‍ය ගොඩනැගිල්ලේ 8 වන මහලේ පිහිටි EGB 23 8/2 දරන සභාධිපත්‍ය මහල් නිවස.

ප්‍රසිද්ධ නොතාරිස් සරෝජිනී මුදළිගේ විසින් 2019 මැයි මස 17 වන දින සහතික කරන ලද අංක 3595 දරන DFCC Bank PLC.) (Successor to DFCC Vardhana Bank PLC) නමට ලියන ලද බැඳුම්කරය මත අයවිය යුතු මුදල ගෙවීමට චන්ද්‍රසේකරම් විශාහන් ණයකරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත (විසිතුරු හා කෑම කාමරයකින් ද, ප්‍රධාන නිදන කාමරයකින් ද, නිදන කාමර දෙකකින් ද, මුළුතැන් ගෙයකින් ද, නාන කාමර දෙකකින් ද හා සඳළුතලයකින් ද සමන්විත) වර්ග මීටර් 105.45) (වර්ග අඩි 1135) විශාලැති සභාධිපත්‍ය මහල් නිවස පොදු පහසුකම් ආදී සියළු දේ සමග

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් "COVID 19" වසංගතය සම්බන්ධයෙන් නිකුත් කරන ලද නිශ්චිත නිර්නායක අනුගමනය කරමින් මෙම වෙන්දේසිය පවත්වනු ලැබේ.

2021 ක් වූ පෙබරවාරි මස 18 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2020.07.10 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද 2020.06.25 වැනි දින දිනපතා ''දිවයින'' ''දී අයිලන්ඩ්'' පුවත් පත් සහ 2020.06.29 වැනි දින ''තිනක්කුරල්'' යන පුවත් පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.-* කොළඹ කොටුවේ සිට කොළඹ - හම්බන්තොට වැල්ලවාය A 2 ප්‍රධාන මාර්ගය ඔස්සේ වැල්ලවත්ත මංසන්දිය දක්වා කි. මී. 7ක් පමණ ගමන් කර වමට ඩබ්ලිව් ඒ සිල්වා මාවත හමුවේ. ඩබ්ලිව් ඒ සිල්වා මාවතේ දකුණට පිහිටා ඇති 3 වන පාර හැම්ප්ඩන් ලේන් වේ. මෙම පාරේ මීටර් 100ක් පමණ දුරකින් වම් පසින් ''හැම්ප්ඩන් රෙසිඩසීස් '' නමැති සභාධිපත්‍ය මහන් නිවාස ගොඩනැගිල්ල හමුවේ. අදල දේපළ මෙම ගොඩනැගිල්ලේ 8 වන මහලේ පිහිටා ඇත. වැල්ලවත්ත මංසන්ධියට කි. මී. 0.5 ක පමණ දුරකින් මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි.- (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් සහ ඒ මත අයවිය යුතු බදු ද, (4) සියළුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතු වන අතර ශ්‍රී ලංකා ආණ්ඩුව විසින යෝ වෙනත් අධිකාරියන් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද ගෙවිය යුතු යි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 73. DFCC බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකරු, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 011-2371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 672082 ෆැක්ස් අංකය : 2871184.

01-412

---

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**
(කලින් ඩී එෆ් සී සී බැංකුව ලෙස හැඳින් වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 6291 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්යේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම මහ නගර සභා සීමාවට අයත් තලවතුගොඩ ග්‍රාමයේ පිහිටි දෙල්ගහවත්ත ලෙස හැඳින්වෙන අංක 9734ඒ දරන පිඹුරේ ලොට් අංක 5 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 23.75 (හෙක්ටයාර් 0.0602) එහි පිහිටි ගොඩනැගිලි, ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව (හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත)

පහත විස්තර කෙරෙන ඉඩම හරහා වැටී ඇති පිවිසීමේ හා පිටවීමේ මාර්ග අයිතිය ද සමග ඉහත කී තලවතුගොඩ ග්‍රාමයේ පිහිටි දෙල්ගහවත්ත ලෙස හැඳින්වෙන, අංක 9734A දරන පිඹුරේ ලොට් අංක 3 (මාර්ගය සඳහා වෙන් කිරීම) ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූ. 0 පර්. 8.72 (හෙක්ටයාර් 0.0220) (හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අතුල වලිසුන්දර විසින් සහතික කරන ලද 2012 මාර්තු මස 14 දිනැති අංක 6291 දරන උකස්කරය ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නීතිගත වූ සහ ලියාපදිංචි අංක PV 15441 දරන එහි ලියාපදිංචි කාර්යාලය හෝමාගම පිහිටි (මින් මතු

සමාගම ලෙස හැඳින්වෙන) සන්පැක් එන්ජිනියර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී (ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික) ට උකස් කරන ලදු වල ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ඨ නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2021 පෙබරවාරි මස 09 වැනි දින අඟහරුවාද දින පෙ. ව. 11.00 ට ඩී. එෆ්. සී. සී. බැංකුව මහරගම ශාඛා පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දෙසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදාල සියළුම බදු,
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තිරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2371371.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ශොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 129 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය:*
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08.
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

01-297

**මහජන බැංකුව -ආයතනික ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**ලියනගේ මුල්ල සීදූව**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසයට අයත් කටුනායක සීදූව නගර සභා සීමාවට අයත් ලියනගේ මුල්ල ග්‍රාමයේ පිහිටි, කුරුවේ මුදියන්සේලාගේ කුරුදුවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද, 2003 ජනවාරි මස 30 වැනි දිනැති අංක 9082ඒ දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙද වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූ. 0 පර්. 20 (හෙක්ටයාර් 0.0506) (එහි පිහිටි ගොඩනැගිලි, වගාවන් සහ සියල්ල සහිතව)

පහත දැක්වෙන බිම් කට්ටි හරහා වැටී ඇති මාර්ග අයිතිය ද සමග.

ලියනගේමුල්ල ග්‍රාමයේ පිහිටි කුරුවේමුදියන්සේලාගේ කුරුදුවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග සාදන ලද, 1986 නොවැම්බර් මස 27 වැනි දිනැති අංක 2586 දරන පිඹුරේ ලොට් අංක ඩී ලෙස දැක්වෙන (අඩි 15ක් පළල මාර්ගයක් සඳහා වෙන්කර ඇත) සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

*දේපළ වෙත පිවිසීම.* - කොළඹ සිට කොළඹ මීගමුව ප්‍රධාන පාරේ කිලෝමීටර් 15 ක් පමණ ගොස් සීදූව මංසන්ධිනයට පැමිණ එතැන් සිට කිලෝමීටර් 2ක් පමණ එම මාර්ගයේ ම ගොස් එයාර්පෝට් ගාඩ්න් හෝටලය දක්වා පැමිණෙන්න. අදල දේපල එම පාරේ දකුණු පසින් පිහිටා ඇත.

අදල දේපළ සී/ස දයාරත්න සහ සමාගම (පුද්ගලික) විසින් මහජන බැංකුවට උකස් කරන ලද්දකි. තීරණය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2009 අගෝස්තු මස 28 වැනි දින රජයේ ගැසට් පත්‍රය බලන්න.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2021 පෙබරවාරි මස 10 වන බදාදා දින පෙ. ව. 11.00 ට මහජන බැංකුව සීදූව ශාඛා පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරනලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය ද වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකාර අයකර ගැනීම්, මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, 10 වන මහල, සර් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවත, කොළඹ 02 වෙත ගෙවිය යුතු වේ.

දුරකථන අංක : 011- 2481443, 011- 2481546.

ඔප්පු පිළිබඳ සහ අනෙකුත් විස්තර සඳහා ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කල පරිදි දින 30ක් ඇතුලත ඉහත සඳහන් කරන ලද මුළු මුදල නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10%ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''.

ෂොක්මන් සහ සමරවික්‍රම.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08.
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

01-296

---

**මහජන බැංකුව - ආයතනික බැංකු අංශය**

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 D යන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

